# පොළොන්නරු යුගය හා කෝට්ටේ යුගයේ දී ශ්‍රී ලංකාවේ භාවිත වූ යුධ උපක්‍රම

**ඩබ්ලිව්.එන්.එන්. ප්‍රියදර්ශනී**

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**සංක්ෂේපය**

ලංකා ඉතිහාසය හැඩගැස්වීමේලා සාධක කිහිපයක් බලපෑ බව පෙනේ. එනම්, දේශපාලන සාධක, භූගෝලීය සාධක, ආර්ථික සාධක, සමාජීය සාධක හා ආගමික සාධකය. වනචාරී අවධියේ සිට වර්තමානය දක්වා ආරක්ෂක කටයුතු ප්‍රධාන විය. විජයාගමනයේ සිට වර්තමානය දක්වා කරුණු විමසා බලන විට ලංකාවේ ආරක්ෂක කටයුතු සංවිධානාත්මක ආකාරයෙන් සකස් වූ ආකාරය පැහැදිලිය. ඒ අනුව මෙමඟින් පොළොන්නරු යුගයේ හා කෝට්ටේ යුගයේ පැවති යුධ උපක්‍රම පිළිබඳව අවධානය යොමු කිරීම සිදුවේ. මේ පිළිබඳව අවධානය යොමු කරන විට පෙර පර්යේෂණ වශයෙන් ක්‍රි. ව. 10.-12 සියවස් තුළ යුධමය සංවිධාන පිළිබඳ පර්යේෂණයක් හා භූගෝලීය සාධක පදනම් කරගත් පර්යේෂණයක් සිදුකර ඇත. මෙහිදී අවධානයට යොමුවන මාතෘකාවෙන් තුළදී යුධමය සංවිධානය සිදු වූ ආකාරය විග්‍රහ කෙරේ.

පොළොන්නරු හා කෝට්ටේ යුගවලදී දේශීය යුධ උපක්‍රම භාවිත වූයේ කෙසේද යන්න පිළිබඳව අවබෝධ කිරීම හා දේශීය යුධ උපක්‍රම පෘතුගීසීන්ගේ පැමිණීමත් සමඟ ඔවුන්ගේ තාක්ෂණික උපක්‍රම සමඟ සටන් කිරීමට ප්‍රමාණවත් වූයේද යන්න පිළිබඳව අවබෝධ කිරීම අරමුණු වශයෙන් සඳහන් කළ හැකිය. මෙහිදී මූලාශ්‍රය අධ්‍යයනය කරමින් පොළොන්නරු යුගයේ පාලකයින් සොළීන්ගෙන් එල්ල වූ තර්ජනවලට මුහුණ දීමට යොදන ලද යුධ උපක්‍රම කෝට්ටේ යුගය වන විට පෘතුගීසීන්ගේ පැමිණීමත් සමඟ කොතරම් දුරට යොදා ගත්තේද යන්න සොයා බැලීම සිදු කරන අතරම ඒවායෙහි සංවිධානාත්මකභාවය පිළිබඳව අවධානය යොමු කිරීම සිදුවේ. දේශීයන්ගේ යුධ උපක්‍රම වශයෙන් දක්වන බලකොටු නිර්මාණය,චරපුරුෂ සේවය වැනි දේ පොළොන්නරු යුගයේ දී භාවිත කරනු ලැබූ අතර ම පෘතුගීසීන්ගේ පැමිණීම සිදු වූ කෝට්ටේ යුගයේ දී ඒවායේ බලපෑම ප්‍රමාණවත් අයුරින් යොදා ගැනීමට හැකිවීද යන්න පිළිබඳව පූර්ව නිගමනයකට එළඹීමට මූලාශ්‍රය පරිශීලනය කරමින් කරුණු අධ්‍යයනය කළ හැකිය. ඒ අනුව ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යොදා ගනිමින් මේ පිළිබඳව අධ්‍යයනය සිදුකළ යුතුය. මහාවංසය, දඹදෙණි අස්න වැනි ප්‍රාථමික මූලාශ්‍රය වැදගත් වේ.

උක්ත කරුණු අනුව සලකා බලන විට පොළොන්නරුව හා කෝට්ටේ යුගවලදී දේශීයන්ගේ උපක්‍රමශීලීත්වය උපයෝගී කර ගනිමින් සංවිධානාත්මක වූ යුධ උපක්‍රම භාවිත කරන ලද බවත් ඒවා උපයෝගී කර ගනිමින් කෝට්ටේ යුගය වන විට පැමිණෙන දියුණු තාක්ෂණය පිළිබඳව අවබෝධයක් ලැබූ පෘතුගීසීන්ගේ ආක්‍රමණවලට මුහුණ දීමට හැකි වූ ආකාරය නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ යුධ උපක්‍රම, පෘතුගීසී, ආක්‍රමණ, දේශීය , තාක්ෂණය

*1. ඉතිහාසය, ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*